**<u>මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව</u>**

**<u>2022 නොවැම්බර් 17 වන දින</u>**

❖ 08 වන සැසි වාරයේ 55 වන සභා වාර්තාව

දිනය :- 2022.11.17 වන දින

වේලාව :- පෙ.ව.10.00

ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය

<u>පැමිණීම</u>

| | | |
|---|---|---|
| 01. | ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. | ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. | ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. | ගරු ප්‍රා.ස.ස. ජේ.එල් ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. | ගරු ප්‍රා.ස.ස. පී කොඩිතුවක්කු මැතිතුමා | පෙ.ව. 10.00 |
| 06. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 07. | ගරු ප්‍රා.ස.ස. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. | ගරු ප්‍රා.ස.ස. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10. | ගරු ප්‍රා.ස.ස. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 11. | ගරු ප්‍රා.ස.ස. ජී.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 12. | ගරු ප්‍රා.ස.ස. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව.10. 00 |
| 13. | ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ජී ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව.10.00 |
| 14. | ගරු ප්‍රා.ස.ස. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව.10.00 |
| 15. | ගරු ප්‍රා.ස.ස. කේ.කේ.ජී. සුමෙත්‍රා මැතිතුමිය | පෙ.ව.10.00 |
| 16. | ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව.10.00 |
| 17. | ගරු ප්‍රා. ස. ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව.10.00 |
| 18. | ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව.10.00 |
| 19. | ගරු ප්‍රා.ස.ස. සුගත් සරඹගේ මැතිතුමා. | පෙ.ව.10.00 |
| 20. | ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව.10.00 |
| 21. | ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය | පෙ.ව.10.00 |
| 22. | ගරු ප්‍රා.ස.ස. එන්.ජී.එස්. වීරසිරි මැතිතුමිය. | පෙ.ව.10.00 |
| 23. | ගරු ප්‍රා.ස.ස. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව.10.00 |
| 24. | ගරු ප්‍රා.ස.ස. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය. | පෙ.ව.10.00 |
| 25. | ගරු ප්‍රා.ස.ස. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා | පෙ.ව.10.00 |
| 26. | ගරු ප්‍රා.ස.ස. ටී.බී. ඉන්දික මැතිතුමා. | පෙ.ව.10.00 |
| 27. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.ජී. සංජීව මැතිතුමා. | පෙ.ව.10.00 |
| 28. | ගරු ප්‍රා.ස.ස. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය | පෙ.ව 10.00 |

**නොපැමිණි**

01. ගරු ප්‍රා.ස.ස. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා

**සහභාගී වූ නිලධාරීන්**

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රන්දුල මයා.

02. කළමනාකරණ සේවා නිළධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු සභිකවරුන් සියළු දෙනා මෙන්ම සහභාගී වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ නොවැම්බර් මස මහ සභා රැස්වීම සඳහා සහභාගී වන ගරු උප සභාපතිතුමන්, හිටපු සභාපතිතුමන් , ගරු සභිකවරුන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගී වන ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.**

2022 නොවැම්බර් මස 17 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව තියෙවිවා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ස.මානෙල් දිසානායක මැතිතුමිය**

ගරු සභාපතිතුමණි, පසුගිය සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම මෙම වාර්තාවේ සඳහන් වෙලා නැහැ. ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා, ගරු ප්‍රා.ස.ස. පී. කොඩිතුවක්කු මැතිතුමා, ගරු ප්‍රා.ස.ස.කේ.රන්ජන් වීරසේකර මැතිතුමා, ගරු ප්‍රා.ස.ස. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය සහ ගරු ප්‍රා.ස.ස.ඩී. රාජපක්ෂ මැතිතුමිය වෙනුවෙන් අසනීප නිවාඩු ලබා දීම මම ස්ථිර කරනවා. එය සංශෝධනයක් ලෙස ඇතුළත් කරන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඒ අයගේ නිවාඩු සංශෝධනයක් ලෙස ඇතුළත් කරන්න. නිහඬතාවයෙන් පෙනී යන්නේ තවදුරටත් පසුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි. ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස සංශෝධිත මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස 20 වන දින පැවති සංශෝධිත මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>02.</u>**<u>ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**<u>03.</u>** <u>ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා</u>

<u>සන්නිවේදන -</u> නැත

**<u>04.</u>** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -</u> නැත

**<u>05.</u>** <u>යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>

**<u>05 – 1. 2023</u>** <u>වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

**2023** වර්ෂය සඳහා අයවැය ඉදිරිපත් කිරීම මැයෙන් අංක කප්‍රාස **08/** ගිණුම හා **2022.11.05** දිනැතිව ඉදිරිපත් කර ඇති සංශෝධිත අයවැය වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය සඳහා අපි විවිධ යෝජනා ඉදිරිපත් කළා. ප්‍රාදේශිය සභාවක අයවැය කියන්නේ මෙහි ප්‍රධානම ලියවිල්ලක්. එමගින් බලාපොරොත්තු වන අරමුණු විශාල ප්‍රමාණයක් තියෙනවා. බල ප්‍රදේශය තුළ ජනතාවගේ සුභ සාධනය වගේම ආදායම් උත්පාදන මාර්ග මෙවැනි අයවැයක් තුළ අන්තර්ගත විය යුතුයි. එම ආදායම් උත්පාදන මාර්ග ඔස්සේ උපයා ගන්නා ආදායමින් ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම කළ යුතුයි. අපි එවැනි ආදායම් උත්පාදන මාර්ග කිහිපයක් යෝජනා කළත් ඒවා මෙම අයවැයට අන්තර්ගත වෙලා නැහැ. මෙහි ඉලක්කම් එහා මෙහා මාරුවීමක් පමණයි සිදුවෙලා තියෙන්නේ. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණෙහි සාමාජිකයින් විදියට අපි අයවැය සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

එතුමන්ලා තම පක්ෂයේ අදහස ඉදිරිපත් කළා. නමුත් අපි ඔබතුමන්ලාගේ යෝජනා හැකි පරිදි අයවැය යෝජනා විදියට ඇතුළත් කරලා තියෙනවා. ඒ පිළිබඳ වාර්තාවක් සකස් කරලා තියෙනවා. ඔබතුමන්ලාගේ යෝජනා අතර කොන්ක්‍රීට් පෙර නිමි අංගනයක් සකස් කිරීමත් , වාහන සේවා කරන ස්ථානයක් සකස් කිරීමක් ඇතුළත් වෙලා තියෙනවා. නමුත් පසුගිය වර්ෂයේ මේ යෝජනා දෙක අපි ඇතුළත් කරනු ලැබුවා. නමුත් ඒ සඳහා පරිසර වාර්තාවන් ලබා ගත නොහැකි නිසා මේ කර්මාන්ත සඳහා අවසර ගැනීමට නොහැකි වුණා. ඒ නිසා තමයි මෙවර අයවැය සඳහා එම යෝජනා ඇතුළත් නොකළේ.

<u>ගරු ප්‍රා.ස.ස.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ අයවැය කෙටුම්පත ගිය සභාවට තමයි ඉදිරිපත් කරලා තිබුණේ. අපිට සංශෝධන ඉදිරිපත් කරන්න කාලය ලබා දුන්නා. එදා නිළධාරින් ගෙනත් සාකච්ඡා කළා. ඒකට අවශ්‍ය තරම් කාලය අපිට ලබා දුන්නා. ඒ ගැන විවාද කරන්න අවශ්‍ය නැහැ. ඒ සංශෝධන ඇතුළත් කළාද යන්න තමයි ප්‍රශ්න කරන්න ඔන. කෙසේ නමුත් අපි සභාවක් විදියට සියලු දෙනාම එක්ව සහයෝගයෙන් යුතුව ජනතාව සඳහා සේවය කරන්න සකස් කරපු අයවැය සඳහා සහයෝගය ලබා දෙමු.

<u>ගරු ප්‍රා.ස.ස.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, 2023 අයවැය පිළිබඳ මටත් යමක් කියන්න තියෙනවා. මම මේ අයවැය හොඳින් අධ්‍යයනය කළා. ඒ සඳහා එය සකස් කරපු නිළධාරි මහතා ගෙන්වා සාකච්ඡා කිරීම වඩාත් ප්‍රයෝජනවත් වුණා. මෙම අයවැය වඩාත් කාලෝචිත විදියට සකස් කරලා තියෙනවා. මෙය ජනතාවට සේවය කරන්න ඉතාම සුදුසු අයවැයක් ලෙස පිළිගන්නා අතර ඒ සඳහා මාගේ විරුද්ධත්වයක් නොමැති බව ප්‍රකාශ කර සිටිනවා.

ඒ අනුව **2023** වර්ෂය සඳහා සකස්කර ඉදිරිපත් කරන ලද සංශෝධිත අයවැය සඳහා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන

**01.**ගරු ප්‍රා.ස.ස. එම්.බී.සුගතදාස මැතිතුමා

**02.**ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ඒ.ආනන්ද කුලසුන්දර මැතිතුමා

**03.**ගරු ප්‍රා.ස.ස.එච්.ජී. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය යන අය විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර ඉතිරි සියලු සභිකවරුන්ගේ කැමැත්ත මත බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

<u>**05 – 2.** සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත හිග දායක මුදල් යොමු කිරීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත හිග දායක මුදල් යොමු කිරීම සම්බන්ධවයි මැයෙන් වැටුප් විෂය නිළධාරි විසින් 2022.11.01 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතුව සිටින සහ සේවයෙන් ඉවත්ව ඇති අනියම්/ ආදේශක හා කොන්ත්‍රාත් සේවයේ සේවක මහත්ම මහත්මීන් සඳහා 2015 අප්‍රේල් මාසයෙන් පසුව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත ගෙවීම් නොකිරීම හේතු කර ගෙන මේ වන විට රු. 1 248 082.83 ක මුදලක් ගෙවිය යුතු බවට එම මණ්ඩලය විසින් 2022.09.26 දින මෙම ආයතනය වෙත දන්වා ඇත. මෙම අදාළ ගෙවීම් අදාල කාල සීමාව තුළ නොගෙවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීම සුදුසු බවත් එම පරීක්ෂණයට යටත්ව අදාළ ගෙවීම් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත ගෙවීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි මෙම සම්බන්ධව සේවකයින්ගෙන් අය කිරීම කරගෙන තියෙනවා . ඒ අය කිරීම සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත යවා නැහැ. කෙසේ නමුත් මේ සම්බන්ධව කාලයකට පසුව තමයි නැවත දැනුම් දිලා තියෙන්නේ.

<u>ගරු ප්‍රා.ස.ස.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>

අපි සේවකයින්ගෙන් අයකරන 8%ක මුදලට අපි 3%ක් දායකත්වය ලබා දෙනවා. ඒ මුදල් අපි සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත යවන්න ඕන. අපේ ගිණුම් වල මේ අයකරනු මුදල් ඇති.

<u>ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ අය කළ මුදල් අපි යැව්වේ නැත්නම් ඒවා අපේ ගිණුම් වල තියෙන්න ඕන.

<u>ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, එතකොට මේ සිදුවීමට හේතුව නිළධාරීන්ගේ අතපසු වීමද? මේ සම්බන්ධව මෙපමණ කාලයකට අභ්‍යන්තර විගණනයට, අනෙකුත් විගණන නිළධාරීන්ට අනාවරණය වුණේ නැද්ද?

<u>ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ඒ.ආනන්ද කුල සුන්දර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මම ක්‍රමවේදය පිළිබඳ අපි දැනුවත්. මේ සේවකයින්ගේ භාරකාර අරමුදලට මුදල් යැවීම පිළිබඳ තමයි කථා කරන්නේ. එහිදී අපි සියලු සේවකයින්ගෙන් අය කරන මුදල් වර්ෂය අවසානයේ එම අරමුදල වෙත යවන්න ඕන. මෙහිදී සභාවේ ඒ අයකරන ලද මුදල් නැත්නම්, යවලත් නැත්නම් ඒ මුදල් වලට මොකද වුනේ කියන ප්‍රශ්නය තියෙනවා. ඒ කියන්නේ අක්‍රමිකතාවයක් වෙලා තියන බව තමයි අපිට හිතෙන්නේ. මේ සම්බන්ධව සේවකයින්ටත් ප්‍රශ්න කරන්න පුළුවන්. අනෙක් කාරණය මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් තුමන් දැනුවත් කර මේ සඳහා පරීක්ෂණයක් සිදු කරන්න.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ මුදල නොගෙවා ඉන්න කොට තව කවත් අධිභාර වෙනවා. ඒ නිසා අපි පරීක්ෂණයක් සිදු කරමු. එහෙත් මේ මුදල ගෙවමු. ඒ කියන්නේ පරීක්ෂණයෙන් පසුව ඒ සම්බන්දව මොනවද වෙලා තියෙන්නේ කියලා බලමු.

<u>ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ඒ.ආනන්ද කුල සුන්දර මැතිතුමා</u>

අපි පරීක්ෂණයකට යටත්ව මේ මුදල ගෙවමු. ඒත් එක්කම මේ සම්බන්ධව අපි සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල වෙත දන්වා යවනවා. පරීක්ෂණය කඩිනමින් සිදු කරලා වාර්තාවක් ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා.

<u>ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>

මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා කියන අතරම මෙවැනි දේ සඳහා අයවැයෙන් මුදල් අපිට වෙන් කරන්න වේනවා. කෙසේ නමුත් පසුගිය සභාවක කථා කළ තවත් මේ ආකාරයේ සිදු වීමක් ලෙස යන්ත්‍රෝපකරණ කුලියට ලබා දීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල් අයකිරීම හඳුන්වන්න පුළුවන්. අපි සභාවට දාලා සාකච්ඡා කරලා යම් විසඳුමක් ගන්න උත්සාහ කරනවා. ලේකම්තුමා සහ ගරු සභාපතිතුමා මේ සම්බන්ධව නිළධාරීන් දැනුවත් කරන්න. ඒ අයගෙන් වන අතපසුවීම් හැකි තාක් අවම කරන්න.

ඒ අනුව 2015 අප්‍රේල් මාසයෙන් පසුව සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත ගෙවීම නොකිරීම හේතු කර ගෙන මේ වන විට රු. 1 248 082.83 ක මුදලක් ගෙවිය යුතු බවට එම මණ්ඩලය ලබා දී ඇති තීරණයට අනුව අදාළ ගෙවීම් අදාළ කාල සීමාව තුළ නොගෙවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීම සම්බන්ධවත් එම පරීක්ෂණයට යටත්ව අදාළ ගෙවීම සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත ගෙවීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 3. මාර්ග දෙපස ඉදිකර ඇති කුඩා ව්‍යාපාර වලින් බදු අය කිරීම සම්බන්ධව

### ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ජී.ආනන්ද කුල සුන්දර මැතිතුමා

කටුවන සහා බල ප්‍රදේශය තුළ මාර්ග දෙපස ඉදිකර ඇති කුඩා ව්‍යාපාර වලින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බදු අය කිරීම සිදු කිරීමට කටයුතු කිරීම තුලින් එම සුළු ව්‍යාපාරිකයින් සඳහා අසාධාරණයක් සිදු වී ඇති බවට පැමිණිලි මා වෙත ලැබී ඇත. එම බදු මුදල් අඩු කිරීම හෝ මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

මේ සඳහා අයිතිය තියෙන්නේ මාර්ග සංවර්ධන අධිකාරියට. ඒ අයට මාර්ග සංවර්ධන අධිකාරිය සමග ගිවිසුම් ගත වෙලා ඉන්න පුළුවන්. ඒත් අවශ්‍ය වූ විට කඩ ඉවත් කර ගන්න වෙනවා. අපිට මේ සම්බන්ධව කරන්න දෙයක් නැහැ. මාර්ග සංවර්ධන අධිකාරිය තමන්ගේ රාජකාරියට අදාළ කටයුතු කරනවා. කඩ හිමියන් අයින් නොකොළොත් අයින් කිරීමට ඒ අයට පුළුවන්.

### ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ජී.ආනන්ද කුල සුන්දර මැතිතුමා

මේ මිනිස්සු තමන්ගේ ජීවිකාව කර ගෙන යන්න යම් යම් දේවල් අලෙවි කරන්න තමයි මේ කුඩා කඩ කාමර පවත්වා ගෙන යන්නේ. මිනිස්සුන්ට සේවයක් කරන ගමන් ඒ අය තමන්ගේ ජීවිකාව කරගෙන යනවා.ඒ අයගෙන් බදු විදියට රු. 2000.00ක් වගේ මුදලක් අයකරනවලු. එවැනි මුදලක් අය කිරීම සුදුසු නැහැ. ඒ මිනිස්සු හිතාගෙන ඉන්නවා මේ ප්‍රදේශ අයිති ප්‍රාදේශීය සභාවට නිසා සභාවෙන් මේ දේවල් කරනවා කියලා. කොහොම වුණත් ඒ මිනිසුන්ගෙන් සාධාරණ මුදලක් අය කරනවා නම් හොඳයි. අපි සභාවක් විදියට මේ සඳහා යෝජනාවක් කරමු.

### ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.බී. හරිස්චන්ද්‍ර මැතිතුමා

ගරු සභාපතිතුමණි, මේ සම්බන්ධව ඔබතුමන්ට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරන්න පුළුවන් නේද? එතන සියලු දෙනාම ඉන්නවා.

### ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා

මාර්ග සංවර්ධන අධිකාරියත් තමන්ගේ රාජකාරිය තමයි කරන්නේ. මිනිස්සු දන්නෙ නැහැ මේ කාර්යයන් සිදු කරන්නේ කොහෙන්ද කියලා.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඔව්, අපි මේ සම්බන්ධව ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවට යොමු කරමු.

ඒ අනුව කටුවන සහ බල ප්‍රදේශය තුළ මාර්ග දෙපස ඉදිකර ඇති කුඩා ව්‍යාපාර වලින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉහළ බදු අය කිරීම සිදු කිරීමට කටයුතු කිරීම තුළින් එම සුළු ව්‍යාපාරිකයින් සඳහා අසාධාරණයක් සිදුවීම සම්බන්ධව ප්‍රාදේශිය සම්බන්ධීකරණ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වලදී සාකච්ඡා කළ හැකි පරිදි දන්වා යැවීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4. ඊසාන දිග මෝසම් වර්ෂා සමයේදී සිදුවිය හැකි ආපදා තත්ත්වය අවම කර ගැනීම සඳහා ක්‍රියා කිරීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඊසාන දිග මෝසම් වර්ෂා සමයේදී සිදුවිය හැකි ආපදා තත්ත්වය අවමකර ගැනීම සඳහා ක්‍රියා කිරීම සම්බන්ධවයි මැයෙන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSH/DMC/P&P හා 2022.11.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව වර්ෂා සමය තුළ බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා තත්වය අවම කර ගැනීමට අදාළ වන කාර්යයන් පිළිබඳ දිස්ත්‍රික් ආපදා කළමණාකරණ සම්බන්ධීකරණ ඒකක සමග සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

වර්ෂාව නිසා අපේ බල ප්‍රදේශය තුළ සිදුවන ආපදා වලදී ක්ෂනික පියවර ගන්න අපේ වාහන , සේවකයන් ලෑස්ති කරලා තියන්න කියලා තමයි ආපදා කළමණාකරණ ඒකකය මගින් කියන්නේ. පසුගිය දිනක අඹගහමන්න මාර්ගයේ බෝක්කුව කඩා වැටුණා, එය සකස් කළා. ඉදල්හේන්ගොඩ පාර බෝක්කුව කඩා වැටිලා එය සකස් කළා. මේ සඳහා යම් වියදමක් අපිට දරන්න වෙනවා. ඒ් එක්කම කැකිරිඔබඩ බුවැල්ලගොඩ මාර්ගයේ පුස්තකාලයාය බෝක්කුව දැනට කැඩී ඇති බැවින් එය සකස් කිරීම සඳහා ඇස්තමේන්තුව සකස් කරලා තියෙනවා. එයත් කඩිනමින් සකස් කරන්න ඕන.

ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා

ගරු සභාපතිතුමණි, කඳු ප්‍රදේශයේ සිටින මහජන නියෝජිතයින් විදියට අපිට මේ ආපදා තත්වය සඳහා වැඩිපුරම මුහුණ දෙන්න වෙනවා. උඩගොමඩිය, අළපොත්ගෙදර කඳු ප්‍රදේශ නිසා වර්ෂාව හේතුවෙන් කාණු පද්ධතිය ගොඩ වෙලා. ඒ නිසා ගෙවල් යටවෙලා. ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම තියෙන්නේ මේ කාණු පද්ධතිය පිරිසිදු කරලා දෙන්න කියන එක. ඒ් එක්කම උඩගොමඩිය පාලම උඩ මඩ පිරිලා. මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවශ්‍ය කටයුතු සිදු කරයිද දන්නේ නැහැ. සභාවෙන් යමක් කරන්න පුළුවන් නම් කරමු.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපි පුළුවන් විදියට අපේ වාහන යොදවලා කාණු ටික ශුද්ධ කරලා දෙන්නම්.

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

ගරු සභාපතිතුමණි, ඉදිරි වැසි කාලයේදී සිදුවන ආපදා තත්වය පිළිබඳ කථා කරද්දී මම වසර 04ක් තිස්සේ කථා කරන කටුවන පාර යටවන සිද්ධියට කාම විසඳුමක් අපිට හොයන්න බැරි වුණා. මේ

සඳහා කාගෙවත් මැදිහත් වීමක් අවශ්‍ය නැහැ. අපිට අවශ්‍ය කටයුතු කරන්න බලය තියෙනවා.ඒ සඳහා මේ ලිපිය වුණත් ප්‍රමාණවත්. මේ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ පහතේ බොහොම පැහැදිලිව පෙන්වා දීලා තියෙනවා. ලේකම්තුමන්ට, තාක්ෂණ නිලධාරීතුමන්ට මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න පුළුවන්. එහෙම නැත්නම් අපිට පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් හරහා උපදෙස් ලබා ගන්න පුළුවන්. ඒ තුමන හෝ ක්‍රමවේදයකින් මේ සඳහා විසඳුමක් ලබා දෙන්න.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි පොලිසියත් මේ කාර්යය සඳහා සම්බන්ධ කරගෙන මේ ප්‍රශ්නය විසඳගන්න බලමු. මම අපේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන්නම්.

<u>ගරු ප්‍රා.ස.ස. සුගත් සරම්ගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මමත් දීර්ඝ කාලයක් තිස්සේ කථා කරන සිද්ධියක් තියෙනවා. රදනිආර නාමතැලිය ගගම බෝවල දක්වා යන මාර්ගයේ බස් කිහිපයක් වැඩ කරනවා. වාහන යනවා. එම මාර්ගයේ අනතුරු සිදු වන ස්ථානය ගැන කථා කළා. එක් පැත්තකින් පැති බැම්ම සකස් කරලා තියෙනවා. නමුත් වාහන අනතුරු සිදුවන ස්ථානයත් නිසා කලින් වැලි කොංචට ටිකක් හරි දමමු කියලා අපි සාකච්ඡා කළා. දැනට එවැනි විසඳුමක් හෝ ලබා දෙන්න පුළුවන් නම් හොඳයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මම ඔය සම්බන්ධව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ කථා කළා. ඒ අය සකස් කරනවා කියලා කියපු නිසා තමයි අපි ඉතුත් නොකළේ. අපි ඒ අය හදන්නේ නැත්නම් ඉක්මණින් හදමු.

<u>ගරු ප්‍රා.ස.ස. එන්.ඒ.එස්. වීරසිරි මැතිතුමිය</u>

ගරු සභාපතිතුමණි, මමත් දිගින් දිගටම කථා කළ සිද්ධියක් ලෙස කෝන්කරගේන සෞඛ්‍ය මධ්‍යස්ථානය අසළ මාර්ගය සකස් කිරීම හඳුන්වන්න පුළුවන්. තවමත් එම ස්ථානය පස් ටිකක් වත් දාලා සකස් කරලා නැහැ. මම කිහිප වතාවක් ඉල්ලීම් කළා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒ සඳහා ඇස්තමේන්තු සකස් කරලා තියෙන්නේ, පසුගිය කාලයේ සියළුම සංවර්ධන කටයුතු නතර කරලා තිබුණ නිසා මේ කටයුත්ත ප්‍රමාද වුණා. පසුගිය මාසයේ නැවතත් සභා තීරණ මත අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කරන්න අනුමැතිය ලැබුණා. දැනට ප්‍රතිපාදන නොමැති ගැටළුව තමයි තියෙන්නේ. අපි ඒ පිළිබඳ සොයා බලලා ප්‍රතිපාදන ඉතිරිව පවතී නම් ඉක්මණින් කරමු.

ඒ අනුව වර්ෂා සමය තුළදී බල ප්‍රදේශය තුළ සිදුවිය හැකි ආපදා තත්වය අවම කර ගැනීමට අදාළ වන කාර්යයන් පිළිබඳ දිස්ත්‍රික් ආපදා කළමණාකරණ සම්බන්ධීකරණ ඒකක සමග සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධවත්, කැකිරිඔබඩ බුවැල්ල ගොඩ මාර්ගයේ පුස්තකාලයාය කැඩී ඇති බෝක්කුව අසළ පැති බැම්ම ඉදිකිරීම සඳහා සකස් කරන ලද රු. 328593.51ක ඇස්තමේන්තුව අනුව එය සභා අරමුදලින් සකස් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 5. 2023 වර්ෂය සඳහා පෙරපාසල් නිළ ඇඳුම් ලබා දීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2023 වර්ෂය සඳහා පෙර පාසල් නිළ ඇඳුම් ලබා දීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 31 හා 2022.11.10 දිනැති ලිපියට අනුව 2023 වර්ෂයේ සභා පෙර පාසල් වලට ඇතුළත් කර ගන්නා දරුවන් සඳහා නිළ ඇඳුම් ලබා දීම පහත ඇස්තමේන්තුව පරිදි ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සභා අරමුදලින් සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

| අනු අංකය | පෙර පාසලේ නම | ළමුන් සංඛ්‍යාව | එක් ළමයෙකුට නිළ ඇඳුම් 02 බැගින් |
|---|---|---|---|
| 01 | මිද්දෙනිය පෙර පාසල | 65 | 130 |
| 02 | කිරම පෙර පාසල | 60 | 120 |
| 03 | ගල්පොතුකන්ද පෙර පාසල | 25 | 50 |
| 04 | ගෝමරගහලගොඩ පෙර පාසල | 25 | 50 |
| 05 | රණසිංහ ගොඩ පෙර පාසල | 25 | 50 |
| | එකතුව | 200 | 400 |

සම්පූර්ණ නිල ඇඳුම් ප්‍රමාණය (200 *2) = 400 යි

එක් නිළ ඇඳුම් කට්ටලයක් සඳහා මුදල = 1800.00

අළ ඇස්තමේන්තු මුදල = 720 000.00

ගරු ප්‍රා.ස.ස.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ ඇස්තමේන්තුවේ සඳහන් ළමයි ප්‍රමාණය අපි දැනට ගන්නවද? හරියටම එම ප්‍රමාණය තීරණය කරන්න පුළුවන්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්, අපිට ගන්න පුළුවන් ප්‍රමාණය තමයි මෙහි සඳහන් කරලා තියෙන්නේ. ඊට වඩා ළමයි 3-4ක් වැඩිවුවත් අපි මේ ප්‍රමාණයට තමයි ඇස්තමේන්තුව සකස් කරලා නිළඇඳුම් ලබා ගන්නේ.

ඒ අනුව 2023 වර්ෂයේ සභා පෙර පාසල් වලට ඇතුළත් කර ගන්නා දරුවන් සඳහා නිළ ඇඳුම් ලබා දීම පහත ඇස්තමේන්තුව පරිදි ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගෙන සභා අරමුදලින් සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 6. මහජන පුස්තකාල සඳහා පොත් ලබා ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මහජන පුස්තකාල සඳහා පොත් ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 31 හා 2022.10.26 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කළුගෙඩිහේන, සපුගස්තැන්න පාර , රෝයල් පාර්ක් ලිපිනයෙහි පදිංචි බී.බී. ආරියවතී මිය විසින් රචිත "දැස අභිමි වූ දියණිය" නම් කෘතිය පුස්තකාල සඳහා මිලදී ගන්නා ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල හතර

සඳහා එම කෘතියෙන් පිටපත් දෙක බැගින් පිටපත් 8ක් සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ කෘතිය මිලදී ගැනීමෙන් ලද මුදලින් කොටසක් ආශාබාධිත දරු දැරියන්ට සහ ආර්ථික අපහසුතා ඇති දරුදැරියන් සඳහා ලබා දෙන බව සඳහන් කරලා තියෙනවා. ඒක ඉතා වටිනවා. ඒත් එක්කම දැන් අපි පුස්තකාල සඳහා පොත් මිලදී ගත්තත් මේ ජංගම දුරකථන සහ අන්තර්ජාලය හේතුවෙන් ළමයි ඇතුළු බොහෝ දෙනෙක් පොත් පත් පරිශීලනය ඉතා අඩු මට්ටමක තමයි තියෙන්නේ. ඒ නිසා මේ පොත් පත් අරගෙන පුස්තකාල වල කබඩ් වල එකතු කර ගෙන ඉන්නවට වඩා ඒ අයගෙන් අවශ්‍යතාවය බලලා ගන්නවා නම් හොඳයි.

ඒ අනුව ඩී.ඩී. ආරියවතී මිය විසින් රචිත "දෑස අහිමි වූ දියණිය" නම් කෘතිය කටුවන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල හතර සඳහා එම කෘතියෙන් පිටපත් දෙක බැගින් පිටපත් 8ක් සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලූ සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 7. කටුවන සහා බල ප්‍රදේශයට අයත් පෙර පාසල් දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීමේ වැඩසටහන</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන සහා බල ප්‍රදේශයට අයත් පෙර පාසල් දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීමේ වැඩසටහන සම්බන්ධවයි මැයෙන් ප්‍රජා සංවර්ධන නිළධාරි විසින් 2022.11.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන සහා බල ප්‍රදේශය තුළ සියලුම පෙර පාසල් ළමුන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා පෙර පාසල් දරුවන්ට ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන පහත ඇස්තමේන්තුව අනුව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සභා අරමුදලින් ලබා දීම <u>සුදුසු</u> බවත් යෝජනා කරමි.

| පෙර පාසල් ළමුන් ගණන | පෙර පාසල් ගණන | වැය වන මුදල |
|---|---|---|
| 1-15 අතර | 39 | රු.366 795.00 |
| 1-30 අතර | 24 | රු.363 840.00 |
| 1-45 අතර | 3 | රු.66 960.00 |
| 1-60 අතර | 4 | රු.152 180.00 |
| | මුළු මුදල | රු.949 775.00 |

ගරු ප්‍රා.ස.ඹ.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

මේ පෙර පාසල් දරුවන් සඳහා කොපමණ කාලයක් ආහාර වේල ලබා දෙන්න පුළුවන්ද?

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

අපි මෙතනදී මේ අරගෙන දෙන ආහාර ද්‍රව්‍ය වලින් පෙර පාසල් දෙමව්පියන්ද එක්ව තමයි කෑම ලබා දෙන්නේ. අපිට ලැබුණු ප්‍රතිපාදන මගින් සතියකට දින දෙකක් බැගින් සහා පෙරපාසල් සඳහා ආහාර ලබා දෙන වැඩසටහනේදීත් දෙමව්පියන් විශාල දායකත්වයක් ලබා දුන්නා. එතනදී එක් ළමයෙකු වෙනුවෙන් රු.60ක් වගේ මුදලක් තමයි වෙන් වෙලා තිබුණේ. නමුත් මෙහිදී රු. 600.00ක් එක් ළමයෙක් වෙනුවෙන් වෙන් කරලා තියෙනවා. එවැනි මුදලකින් ලබා ගන්න පුළුවන් ප්‍රමාණයේ ද්‍රව්‍යමය ආහාර අපි ලබා දුන්නම එම දෙමාපියන් එකතුවෙලා ආහාර වේල් සකස් කරලා දේවි. අපිට මේ තියන ප්‍රතිපාදන මගින් ලබා දෙන්න පුළුවන් ප්‍රමාණය සහා බල ප්‍රදේශයේ සියලුම පෙර පාසල් සඳහා හැකි පමණින් ලබා දෙමු.

<u>**ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**</u>

මේ කටයුත්ත ඵලදායි නැහැ කියලා තමයි මම කියන්නේ. මොකද අපිට දවස් 10ක් ආහාර වේල බැගින් ලබා දීලා දරුවන්ගේ මන්දපෝෂණය නැති කරන්න බැහැ. මම ගිය සභාවෙත් යෝජනා කළේ වර්ෂය පුරාම ළමයින්ට ප්‍රයෝජනවත් වන දෙයක් දෙන්න කියලා. මොකද පසුගිය දිනවල පාසල් ලිපි ද්‍රව්‍ය ඇතුළු සියලුම පාසල් උපකරණ මිල ඉතා විශාල ලෙස ඉහළ ගියා. දෙමව්පියන්ට ඒ දේවල් අරගෙන දෙන්න ගියාම බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා අපිට ඒ සඳහා යම් දෙයක් දෙන්න පුළුවන් නම් ඒක වටිනවා. දැන් පළමු වසරට භාර දෙන ළමයින්ට අවශ්‍ය පාසල් ද්‍රව්‍ය සඳහා රු. 15 000.00ට අධික වියදමක් යනවා.

<u>**ගරු ප්‍රා.ස.ස. එම්.ඩී. සුගතදාස මැතිතුමා**</u>

ගරු සභාපතිතුමනි, අපිට මෙතන තියන මුදල් ප්‍රමාණය ලක්ෂ නවයකට ආසන්නයි. සහා බල ප්‍රදේශය තුළ සිටින පෙර පාසල් ළමයින් ප්‍රමාණයට අදාළව මේ මුදල් ප්‍රමාණය බෙදා වෙන් කරලා ඒ මුදල් දෙනවානම් අවශ්‍ය ද්‍රව්‍ය පෙර පාසල් මගින් අරගෙන ආහාර ලබා දේවි.

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

අපි එහෙම තමයි කරන්න සැලසුම් කරලා තියෙන්නේ. අපි මුදල් බෙදා වෙන් කරලා ඒ මුදලට සරිලන ආහාර ද්‍රව්‍ය පෙර පාසල වෙත ලබා දෙනවා.

ඒ අනුව කටුවන සහා බල ප්‍රදේශය තුළ සියලුම පෙර පාසල් ළමුන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා පෙර පාසල් දරුවන්ට ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන සකස් කර ඇති ඇස්තමේන්තුව අනුව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය මත සහා අරමුදලින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වාර්තා</u>

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.09.05 වන දින</u>

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

2022.11. 08 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 91 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බවත් යෝජනා අංක 01 ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව,නාවින්න,මහරගම | කටුවන ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද මධ්‍යස්ථානයන්ට 2022 දෙවන කාර්තුව සඳහා අවශ්‍ය ඖෂධ වර්ග මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 473092.00 |
| 2. | සාමාන්‍යාධිකාරී,ශ්‍රී ලංකා දුම්රිය සේවය,කොළඹ 10 | 2022 ජුනි මාසයට අදාල ඉන්වොයිස් අංක 2022761606 දරන Z836322 මුදල් ගෙවීම | 2640.00 |
| 3. | ටවර් හෝල් රඟහල පදනම,අංක 123,විජේරාම මාවත,කොළඹ 07 | ටවර් හෝල් රඟහල විසින් ප්‍රකාශයට පත් කර ඇති කෘති 15 බැගින් කට්ටල 04 ක් මහජන පුස්තකාල සඳහා ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 7770.00 |
| 4. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 සැප්තැම්බර් මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 8730.00 |
| 5. | ජේනක ගුණරත්න මයා,රියදුරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුලි මස අතිකාල දීමනා ගෙවීම | 3750.00 |
| 6. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 16560.00 |
| 7. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8855.00 |
| 8. | කේ.ජේ.නාලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 13646.00 |
| 9. | බී.ජී.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 10053.00 |
| 10. | සහන් චතුරංග මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7115.00 |
| 11. | එම්.එස්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 5050.00 |
| 12. | එස්.ජේ.චන්දන මයා,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 14221.00 |
| 13. | පී.දයාසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම | 4331.00 |
| 14. | ජී.කේ.ජී.ක්‍රිශාන්ත මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7169.00 |
| 15. | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8583.00 |
| 16. | ප්‍රියන්ත ඒකනායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7594.00 |
| 17. | එම්.ගාමිණී මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 1256.00 |
| 18. | පුෂ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9249.00 |
| 19. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2603.00 |
| 20. | එස්.පී.අමිල සම්පත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3789.00 |

| | | | |
|---|---|---|---|
| 21. | වයි.වී.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7111.00 |
| 22. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7523.00 |
| 23. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 4218.00 |
| 24. | එම්.අමරසේකර මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7021.00 |
| 25. | කුමාර පලිහක්කාර මයා, ,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2656.00 |
| 26. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8956.00 |
| 27. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8515.00 |
| 28. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 11215.00 |
| 29. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6678.00 |
| 30. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 53-5716 කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 39075.00 |
| 31. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | මීද්දෙනිය ජන උද්‍යානගම ජල පොම්පාගාරය අසල ක්‍රීඩාංගනයෙහි 2022/08/11 සිට 2022/08/21 දින දක්වා පවත්වන ලද තොරණ හා සැණකෙළියෙහි තැන්පත් මුදල් විශේෂ බදු ආදායමට මාරු කිරීම | 156000.00 |
| 32. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා දුම් වාර්තා හා ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 35000.00 |
| 33. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.09.28 සිට 2022.10.11 දක්වා) | 14380.00 |
| 34. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 35. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 14700.00 |
| 36. | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 14000.00 |
| 37. | හෝමසිටි ස්ටෝර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,රත්න පාර,අඟුණුකොළපැලැස්ස | ආදාහනාගාරය සඳහා 37.5kg ගෑස් පිරවූ ගෑස් සිලින්ඩර් 10 ක් 2022.10.17 දින මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 175500.00 |
| 38. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම (2022.10.07 සිට 2022.10.18 දක්වා) | 13180.00 |
| 39. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම (2022.10.04 සිට 2022.10.14 දක්වා) | 7900.00 |
| 40. | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස ගමන් වියදම් ගෙවීම | 1223.00 |

| | | | |
|---|---|---|---|
| 41. | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1400.00 |
| 42. | එම්.එස්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 5250.00 |
| 43. | සහන් චතුරංග මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 5250.00 |
| 44. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1050.00 |
| 45. | එස්.දුෂාන්ති මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3750.00 |
| 46. | එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6200.00 |
| 47. | අයි.ජී.මංජුල මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3882.00 |
| 48. | කේ.කේ.නාලක තුෂාන් මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | රියදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා වැය වූ මුදල් ගෙවීම(රා.ප.ච. 04/2009i හා 04/2009) | 4525.00 |
| 49. | ජී.ඒ.රංජිත් මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | රියදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා වැය වූ මුදල් ගෙවීම(රා.ප.ච. 04/2009i හා 04/2009) | 4525.00 |
| 50. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා දුම් පරීක්ෂණ වාර්තාව හා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත් අත්තිකාරම් පියවීම(PF-7414කැබ් රථය,RX-2045ට්‍රැක්ටරය,BAK-9907යතුරු පැදිය,LK-9589ටිපර් රථය,RC-5539ට්‍රැක්ටරය,270-0429ට්‍රැක්ටරය) | 32665.00 |
| 51. | පළාත්භාර අධ්‍යක්ෂ (දකුණ) මාර්ග සංවර්ධන අධිකාරිය,මාතර | 2022 මැයි මස 05 දින ප්‍රාදේශීය සභාව ඉදිරිපිට මිද්දෙනිය වීරකැටිය මාර්ගයේ මාර්ග පළුදු කිරීම වෙනුවෙන් ගෙවූ රු.43665.93ක මුදලට නාව වැට් සංශෝධන මුදල ලෙස 3% ක මුදල් ගෙවීම | 1169.62 |
| 52. | මෙට්‍රො කම්පියුටර් ටෙක්නොලජී,අංක 02,කාලිදාස මාවත,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය photo paper 42 ක් (අයවැය ලේඛන සකස් කිරීමට) මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 4410.00 |
| 53. | පෝස්ට් මාස්ටර් ජනරාල්,තැපැල් කාර්යාලය,මිද්දෙනිය | 2022.10.31 දින සිට ඉදිරියට ලිපි තැපැල් කිරීම වෙනුවෙන් තැපැල් ගාස්තු ගෙවීම | 35000.00 |
| 54. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.10.13 දින පැවති සැලසුම් කමිටුව සඳහා දීමනාව ගෙවීම | 6000.00 |
| 55. | බී.එම්.සී.පී.බාලසූරිය,506 ,පහාපිටිය පාර,පොකුපිටිය,වාද්දුව | කටුවන ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශය,ජල අංශය වැනි අත්‍යවශ්‍ය සේවා අංශවල සේවය කරන සේවකයින්ට වැහි කබා,බූට්ස් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 33420.00 |
| 56. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කිරම උප කාර්යාලීය සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 5000.00 |
| 57. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම (2022.10.13 සිට 2022.10.25 දක්වා) | 13380.00 |
| 58. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම (2022.10.14 සිට 2022.11.01 දක්වා) | 4085.00 |
| 59. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තේ කොළ 1.25g,සුදු සීනි 2kg,හකුරු පැකට් 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 4760.00 |

| | | | |
|---|---|---|---|
| 60. | එම්.දිනුෂ්ත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 61. | ලංකා හොස්ට් වෙබ් සොලූෂන්ස්(ප්‍රයිවට්) ලිමිටඩ්,නො 94,උදේශි සිටි බිල්ඩින්,මාකොළ පාර,කිරිබත්ගොඩ | Katuwana p.s.gov.lk lanka host ආයතනයේ පවත්වාගෙන යනු ලබන කටුවන ප්‍රාදේශීය සභාවේ වෙබ් අඩවියේ වර්තමාන ධාරිතාව වන 2GB ප්‍රමාණය 4GB small business plan එකක් දක්වා යාවත්කාලීන කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල් ගෙවීම | 1868.49 |
| 62. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 4400.00 |
| 63. | එම්.ශ්‍රියානි හේමලතා මිය,පෙර පාසල් ගුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1140.00 |
| 64. | ඉන්ද්‍රානි ජයසිංහ මිය, පෙර පාසල් ගුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1080.00 |
| 65. | එච්.ජී.අනුකා ප්‍රියන්ති මිය, පෙර පාසල් ගුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1140.00 |
| 66. | ටී.එම්.ධම්මිකා මිය, පෙර පාසල් ගුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1140.00 |
| 67. | ජී.එල්.සිරියාවතී මිය, පෙර පාසල් ගුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1060.00 |
| 68. | පමෝදා අරුණප්‍රභා යාපා මිය,කළමනාකරණ සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 7503.00 |
| 69. | ඩබ්.සුභාෂණී මිය,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2800.00 |
| 70. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2100.00 |
| 71. | එම්.දිනුෂ්ත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම | 11800.00 |
| 72. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස පොළ අධීක්ෂණ දීමනා ගෙවීම | 2000.00 |
| 73. | එස්.දුෂාන්ති මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස පොළ අධීක්ෂණ දීමනා ගෙවීම | 2000.00 |
| 74. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 75. | ඒ.වී.පී.යමුනා නිල්මිණි මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6200.00 |
| 76. | කේ.සී.සංජීව මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 4400.00 |
| 77. | සී.ආර්.රවිනා මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස චරිපහාම් ප්‍රතිශෝධන කටයුතුවලට සහය වීම වෙනුවෙන් දීමනා ගෙවීම | 32000.00 |
| 78. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම (2022.09.20 සිට 2022.10.20 දක්වා) | 6200.00 |
| 79. | ලේකම්,කටුවන ප්‍රාදේශීය සභාව | රුක්ගහදෙළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් වැඩිපුර බිල් කරන ලද මුදල නැවත අය කර ගැනීම | 14501.85 |

| | | | |
|---|---|---|---|
| 80. | ඩී.බී.ජේ.පුෂ්පකුමාර මයා,ජනාභිත මෝටර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | RE-9230 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 7170.00 |
| 81. | ඩී.බී.ජේ.පුෂ්පකුමාර මයා,ජනාභිත මෝටර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | RB-3498 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 12000.00 |
| 82. | කේ.එස්.එස්.සී සමරසිංහ මයා,සූරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | MG-330 මෝටර්ග්‍රේඩරය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම | 74780.00 |
| 83. | විශිත සර්විස් සෙන්ටර්,කටුවන පාර,මිද්දෙනිය | RE-9230 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 22250.00 |
| 84. | ජේ.ඩිලාන් මයා,මිද්දෙනිය පාර්ශ්ව,කටුවන | 2022 ඔක්තෝම්බර් මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 11590.00 |
| 85. | සාමාන්‍යාධිකාරී, සි/ස වි.සේ.සමූපාකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශිය සභාව සඳහා 2022.10.11 සිට 2022.10.31 දක්වා ඉන්ධන බිල සඳහා ගෙවීම කිරීම<br>• RE – 9230 - ඩීසල් 140L<br>• 227-5163 - ඩීසල් 100L<br>• RE-8995 ඩීසල් 80 L<br>• PF – 7414 - ඩීසල් 269 L<br>• 53-1634 -ඩීසල් - 20 L<br>• LK – 9589 - ඩීසල් 165L<br>• LL – 7399 - ඩීසල් 100L<br>• 227-5870 - ඩීසල් 120L<br>• 252- 6508 - ඩීසල් 345L<br>• BAK – 9907- පෙට්‍රල් - 20L<br>• RB- 3498 - ඩීසල් 20 L<br>• RC- 5539- ඩීසල් - 60L<br>• LL- 6446 - ඩීසල් - 50 L<br>• ගබඩාව - පෙට්‍රල්- 20L<br>• RD – 4364 - ඩීසල් 20L<br>• ZA- 2978- ඩීසල් - 20L | 649145.00 |
| 86. | නිව ඔස්මන් ඉලෙක්ට්‍රිකල්ස්,පළමු පටුමග,වීරකැටිය පාර,වලස්මුල්ල | කටුවන ප්‍රාදේශිය සභාව සතු මිද්දෙනිය උප කාර්යාලයේ ඇති SG-SYMST මාදිලියේ විදුලි ජනක යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම | 14500.00 |
| 87. | ජී.පී.එච්.ප්‍රියන්ත මයා,මහින්ද සයිකල් ස්ටෝර්ස්,හෙක්ප්‍රිය බිල්ඩින්ස්,වීරකැටිය පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශිය සභාවේ අවකාශ ඉඩමේ ජල පොම්පාගාරය වයරින් කිරීම සඳහා උපාංග වෙනුවෙන් ගෙවීම | 42470.00 |
| 88. | කේ.ආර්.නිශාන්ති මිය,ඕගෝලි වයිනිස් හොටෙල්,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශිය සභාවේ ඔක්තෝම්බර් මස 20 දින පැවති මහා සභාවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම කිරීම(දිවා ආහාරය හා තේ පානය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන්) | 42080.00 |
| 89. | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝ මේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, යුනියන් පෙදෙස, කොළඹ 02 | කටුවන ප්‍රාදේශිය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ භාවිතා කරන DD 02195 දරන ඩුප්ලෝ යන්ත්‍රයේ සේවා ගිවිසුම අළුත් කිරීම සඳහා ගෙවීම කිරීම | 17399.50 |
| 90. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශිය සභාව | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම (2022.10.13 සිට 2022.10.20 දක්වා) | 13180.00 |
| 91. | මනම්පේරි ස්ටෝර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශිය සභාව යටතේ පවතින මිද්දෙනිය,කිරම,රණසිංහගොඩ,ගල්පොතුක | |

| | | | |
|---|---|---|---|
| | | න්ද,මොරගහලංගොඩ පෙර පාසල් ළමුන් සඳහා දිවා ආහාරය ලබා දීම වෙනුවෙන් ගෙවීම(එක් පෙර පාසලක් සඳහා දින 08ක්) | 79840.50 |

ඉහත වවුචර් අංක 01 සිට 91 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) රට තුළ පවතින බලශක්ති අර්බුදය හේතුවෙන් කාර්යාල වේලාවන්හිදී ද විදුලිය විසන්ධි වීම සිදු වන නිසා එම කාලයන්හිදී කාර්යාල කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ආලෝයක් නොපවතී.ඒ බැවින් ගරු සභාපතිතුමාගේ හා ලේකම්තුමාගේ නිල කාමරවලට rechargeble විදුලි පහන් 02 ක් ලබා ගැනීමට සුදුසු බව යෝජනා විය.

ගරු ප්‍රා.ස.ස. ටී.බී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව අංක 01 සිට 91 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදික අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 ඔක්තෝම්බර් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය සැරණි පොළ මාළු ලැලි මගින් රු.548 700.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 61 180.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.487 520.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමණි, අපේ මිද්දෙනිය තොග පොළට බඩු පැමිණීම ඉතාම අඩුයි. මුල්ඇඩියාවල තමයි දැනට තොග පොළ සාර්ථකව කරගෙන යන්නේ. අවට ප්‍රදේශ වලට අමතරව මිද්දෙනිය ප්‍රදේශයේ පවා තොග බඩු එහෙට අරගෙන යනවා. ඒ නිසා මිද්දෙනිය තොග පොළ සාර්ථක නැහැ.

**ගරු ප්‍රා.ස.ස. ජේ.එල්. ජයන්ත මැතිතුමා**

ගරු සභාපතිතුමණි, තොග පොළට බඩු එන්නේ නැති හේතුව තමයි වෙළෙන්දො බඩු මිලදී ගන්න නිවෙස් වලට යාම. එළවළු කොරටු වලින්ම බඩු මිලදී ගත්තම වෙළෙඳ පොළට එන්නේ නැහැ.

**ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා**

ඒත් එක්කම මිද්දෙනිය පොලේ වෙළෙන්දො පිරිසක් පිටතින් එන වෙළෙඳුන්ට බඩු ගන්න අවස්ථාව නොදීම නිසා තමයි මෙතන සාර්ථක වෙළෙඳාමක් කරන්න බැරි. මේ සඳහා අතරමැදියො මැදිහත් වෙලා බඩු ටික ගන්න ක්‍රමවේදයක් හදාගෙන. ඒක තමයි මේ අසාර්ථකත්වයට හේතුව.

මුල්ඇඩියාවල පොළේ නිශ්චිත වෙලාවක් නියම කරලා තියෙනවා බදු ගන්න පුළුවන්. ඒ ක්‍රමය සාර්ථකයි.

ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

ගරු සභාපතිතුමණි, අපි මේ සඳහා විසඳුමක් විදියට මාස 3ක පමණ කාලයක් බදු අය නොකර තොග පොළ පවත්වලා වෙළෙන්දො ගෙන්වා ගන්න පුළුවන් ක්‍රමවේදයක් යොදමු. එහෙම නැත්නම් නිශ්චිත වෙලාවක් යොදමු. ඒ පිළිබඳ අන්තර්ජාලය හරහා ජනතාව දැනුවත් කරමු.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

එහෙම ක්‍රමවේදයකට යන්න තියෙනවා නම් හොඳයි. එතකොට වෙළෙන්දො ටිකක් නැවත ගෙන්න ගන්න පුළුවන්. නමුත් සභාවට ලැබෙන ආදායම අපිට අහිමි කරන්න පුළුවන්ද කියන එක ගැටළුවක්. අපි යම් සහනයක් ලබා දීලා බලමු.

ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා

තොග පොළ සඳහා ඔය ස්ථානයට වාහන ඇතුළු කිරීමෙත් ගැටළුවක් තියෙනවා.

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා

අපිට සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිරිපිට තොග වෙළෙඳාම සඳහා යොදා ගන්න පුළුවන්. ඒ සඳහා ස්ථිර වෙලාවක් යොදා ගනිමු.උදේ 5.00 ට පමණ එතනට ඇවිත් බඩු විකුණලා වෙළෙඳපොළට යන්න පුළුවන්. වෙළෙඳුන්ට සහනයක් විදියට සුළු මුදලක් අය කරමු.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපි දැන්වීමක් මගින් වෙළෙන්දො දැනුවත් කරලා සහන ගාස්තුවක් අයකරමු.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 ඔක්තෝම්බර් මස

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 ඔක්තෝම්බර් මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:511 750.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,වියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු:514 082.00 ක වියදමක් දරා ඇත. එමෙන්ම මෙම යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් රු:2 332.00 ක අලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.ස. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 ඔක්තෝම්බර්

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා ඔක්තෝම්බර් මස රු.1 264 735.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති බැවින් සියලු සභිකවරුන්ගේ ඒකගතාවය මත සභා සම්මත කරන ලදී.

## <u>06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 අගෝස්තු මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 ජුලි මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 1 621 376.72 වන අතර මාසික වියදම රු.1 103 961.30ක් වෙ. ඒ අනුව මාසික ලාභය රු: 517 415.42කි. ඒ අනුව අගෝස්තු මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස. ජේ.එල්. ජයන්ත මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, අපේ 2023 වර්ෂයේ අයවැයට ජල ව්‍යාපෘතිය සම්බන්ධව කිසියම් සංවර්ධන කටයුත්තක් ඇතුළත් වෙලා නැහැ. මේක කරන්න අපහසුයි. නමුත් ජල ව්‍යාපෘතියෙන් අපි ආදායමක් ලබන නිසා මිනිසුන්ට හොඳ වතුර ටිකක් දෙන්න ෆිල්ටර් පද්ධතියක් සකස් කරමු. අපිට මේක බිබුල ජල පොම්පාගාරයට හරි පිරිපහදු කිරීම කරලා බලන්න පුළුවන්. ගෙවල් වලට ගිහින් බලන්න ඕන මිනිස්සු මොන වගේ වතුරද පාවිච්චි කරන්නේ කියලා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි කුඩගොඩ ඒ ආකාරයේ ෆිල්ටර් පද්ධතියක් සවි කරලා තියෙනවා. නමුත් ජලය බෙදාහරිද්දී මිශ්‍ර වීම හේතුවෙන් අපිට පිරිපහදු කළ ජලය පමණක් ලබා ගන්න බැහැ. පසුගිය දිනක පළාත් සංවර්ධන සැලැස්මට යෝජනා ඉල්ලුම් කරලා තිබුණා. අපි ජල පිරිපහදු පද්ධතියක් ලබා දීමේ යෝජනාව ඒ සඳහා නම් කරලා යවමු.

ඒ අනුව 2022 අගෝස්තු මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම - 2022 අගෝස්තු මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 අගෝස්තු මස වන විට ආරම්භක හිඟය රු: 6 712 595.08ක් වන අතර ජුලි මස අවසාන හිඟය රු: 6163809.08ක් වෙ. ඒ අනුව හිඟයේ වෙනස රු: 548 786.00ක් වන අතර හිඟය අඩු වී ඇත. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.ඒම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>

අපි මේ ජනතාවට ජලය ටිකක් ලබා දෙන එක ගැන මේ සභාව තුළ කොපමණ කථා කළත් මේ සඳහා සභාවක් විදියට අපිට කරන්න පුළුවන් දෙයක් නැහැ. මේ සඳහා මධ්‍යම රජය හෝ ජාතික වශයෙන් මැදිහත් වීමක් විය යුතුයි. ඒත් එක්කම අපිට දැනට ක්‍රියාත්මක වන කැකිරිඔබඩ ජල යෝජනා ක්‍රමය කොතරම් දුරට ලබා දෙන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ. නමුත් මුරුතවෙල ජල යෝජනා

ක්‍රමය අනිවාර්යයෙන්ම විශාල ධාරිතාවයකින් යුතුව පවතින නිසා එය අපිට යෝජනාවක් විදියට සම්බන්ධීකරණ කමිටුවේදී යෝජනා කරන්න පුළුවන්, කෙසේ හෝ මෙය අපිට සභාවේ යෝජනාවක් විදියට ගරු මහින්ද අමරවීර මැතිතුමන්ට යවලා යම් විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙයි. එතුමන් කිහිප ස්ථානයක එවැනි කටයුතු වලට සම්බන්ධ වෙලා තියෙනවා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි සභාවේ යෝජනාවක් විදියට ඉල්ලීමක් කරලා බලමු.

<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.ඒම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>

ඒත් එක්කම ගරු සභාපතිතුමා මිද්දෙනිය පන්සලේ විදුලි බිලෙහි හිඟ මුදල සහ මාසිකව යන මුදල වෙන් වෙන්ව සඳහන් කරලා බිලෙහි දක්වන්න පුළුවන් නම් හොඳයි කියලා විහාරාධිපති හාමුදුරුවන්වහන්සේ දැනුම් දුන්නා. ඒ විදියට සඳහන් කරලා දෙන්න. අපේ සනත් මන්ත්‍රීතුමන් මේ සඳහා ලොකු කැපකිරීමක් කරනවා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒක බිලෙහි සටහන් වෙනවා. අපිට මුළු බිලෙන් මාසික බිල අඩු කළාම හිඟය ලබා ගන්න පුළුවන්.

<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.</u>

මම පසුගිය මාස කිහිපයක් මේ විහාරස්ථානයේ ජල බිලෙහි හිඟ මුදල් ගෙවන්න දායක වුණා. නැවත වගේගොඩ පන්සලේ නායක ස්වාමීන් වහන්සේට මම කතා කරන්නම්. අපි කෙසේ හෝ මේ හිඟ මුදල ශේෂ කරන්න කටයුතු කරමු.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 අගෝස්තු මස මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 14,16,07 වාර්ථා</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 14,16 ,07 ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 ඔක්තෝම්බර් මස ප්‍රා.ස. 16 ,14,07 වාර්තා

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16,14,07 වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

### 08-1. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සහ ස්ථාවර සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සහ ස්ථාවර සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස/සං/36/01/භා.ස/2022 හා 2022.11.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2022.12.31න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ හා ස්ථාවර වත්කම් සමීක්ෂණ කටයුතු සඳහා පහත සංයුතියෙන් යුතුව කමිටු පත් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

01.ගරු ප්‍රාදේශිය සභා සභිකවරුන් -04

02. ලේකම්තුමා

03. හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිළධාරියෙකු

04.කටුවන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිළධාරියෙකු

05. විෂය නිළධාරී ඇතුළු නිළධාරීන් 05

ස්ථාවර වත්කම සමීක්ෂණය

01. ගරු ප්‍රාදේශිය සභා සභිකවරුන් -02

02. ලේකම්තුමා

03. විෂය නිළධාරී ඇතුළු නිළධාරීන් 05

ගරු ප්‍රා.ස.ස. අයි.කේ. ප්‍රසන්න පද්ම තිලක් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ගිය වර්ෂයේ සමීක්ෂණ මන්ඩල වල සිටි අය පත් කරමු. ගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සිටි ගරු ප්‍රා.ස.ස යූ.ජී. ධර්මසිරි මැතිතුමන් වෙනුවට ගරු ප්‍රා.ස. ස. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා පත් කරමු.

**ගරු ප්‍රා.ස.ස. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා**

ඒ යෝජනාව මම ස්ථිර කරනවා. අපි ගිය වර්ෂයේ සිටි මහජන නියෝජිතයින් මේ සඳහා පත් කරමු. ඒත් එක්කම ගරු ප්‍රා.ස.ස. සනත් මැතිතුමා එම කමිටුවට ඇතුළත් කරමු.

ඒ අනුව 2022.12.31න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ හා ස්ථාවර වත්කම් සමීක්ෂණ කටයුතු සඳහා පහත සාමාජිකයින්ගෙන් යුත් කමිටු පත් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

01.ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා ( සභාපති)

02. ගරු ප්‍රා.ස.ස.එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා

03. ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

04. ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා

05. ලේකම් එම්.දිනුෂින් රත්දූල මහතා

06. සංවර්ධන නිළධාරී එච්.ජී. චමින්ද වික්‍රමසිංහ මහතා

07. කළමණාකරණ සේවා නිළධාරී ජී. අනුරුද්ධිකා මිය

08. සංවර්ධන නිළධාරි ආර්.පී. උදේෂිකා මිය

09.සංවර්ධන නිළධාරි ඒ.ඩබ්.ගායනි මිය

10.සංවර්ධන නිළධාරි කේ.පී.රම්‍යසිරි සදරුවන් මහතා

11.හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිළධාරියෙකු

12.කටුවන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිළධාරියෙකු

<u>ස්ථාවර වත්කම් සමීක්ෂණය</u>

01.ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා

02. ගරු ප්‍රා.ස.ස. එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමිය

03.ලේකම් එම්.දිනුජිත් රන්දුල මයා

04.සංවර්ධන නිළධාරි එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා

05.සංවර්ධන නිළධාරි කේ.සී.සංජීව මයා

06.සංවර්ධන නිළධාරි ඒ.ඩබ්.ගායනි මිය

07.තාක්ෂණ සේවා නිළධාරී ඩබ්.ආර්.කුමාර මයා

08.ආදායම් පරික්ෂක එම්.චම්පිකා චතුරානි මිය

## <u>08-2. මාර්ග සංවර්ධනය කිරීමට අදාළ සාධාරණීකරණ වාර්තා සඳහා අනුමැතිය ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

මාර්ග සංවර්ධනය කිරීමට අදාළ සාධාරණීකරණ වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 09 හා 2022.11.11 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් මාර්ග වලට අදාල සාධාරනීකරණ වාර්තාවන් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

01.කන්දහේන මාර්ගය කොන්ක්‍රිට් කිරීම (දයාරත්න මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය)

02.බෙංගමුකන්ද උඩබංගලාව මාර්ගය කපා සකස් කිරීම

03.බෙංගමුකන්ද යොවුන් මාවත කපා සකස් කිරීම

04.ගොරකගහගොඩ පංගම්විලයාය මාර්ගය කපා සකස් කිරීම

05.ජලපොම්පාගාරයේ සිට අක්කර 15 දක්වා මාර්ගය කපා සකස් කිරීම

06.දඹෙලන්ද පහළ අලුපොත්දෙනිය මාර්ගය කපා සකස් කිරීම

07.නියදිගල හංදියේ සිට කුඩාහල්ආර දක්වා මාර්ගය සංවර්ධනය කපා සකස් කිරීම

08.උලගිටියාව බටහිර කොට්ටම්බ ගස සිට කෝපිවත්ත මාර්ගය කපා සකස් කිරීම

09.රම්මල පළමු පියවර බුදු මැදුර අසලින් ඇති මාර්ගය කපා සකස් කිරීම

10.වීදිපොළ කිත්තලයාය දෙනියකන්ද මාර්ගය කපා සකස් කිරීම

11.කැකිරිඔබඩ මුවැල්ලගොඩ මාර්ගයේ පුස්තකාලයාය කැබී ඇති බෝක්කුව අසල ඇති පැති බැම්ම සකස් කිරීම

12.එගොඩබැද්ද වරාපිටිය මාර්ගයේ ආරම්භක ස්ථානයේ ඇති බෝක්කුව අසල පැති බැම්ම සකස් කිරීම

ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙම සංවර්ධන කටයුතු සඳහා සකස් කරන ලද සාධාරණීකරණ වාර්තාවන් පරීක්ෂා කර බලා අනුමැතිය ලබා දෙන්න.

ඒ අනුව කටුවන සහ බල ප්‍රදේශයෙහි සංවර්ධනය සඳහා නිර්දේශිත මාර්ග සංවර්ධනය සඳහා සකස් කරන ලද සාධාරණීකරණ වාර්තා අනුමත කිරීම සම්බන්ධවත් ඒ අනුව අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම සම්බන්ධවත් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-3 භාණ්ඩ මිලදී ගැනීමේදී ණය සහන කාල සීමාවන් ලබා නොදීම සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

භාණ්ඩ මිලදී ගැනීමේදී ණය සහන කාල සීමාවන් ලබා නොදීම මැයෙන් අංක කප්‍රාස /16/සැපයුම් හා 2022.11.15 දිනැති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාව සඳහා ඇතැම් ආයතන මගින් ( නියෝජිත ආයතනද ඇතුළුව) භාණ්ඩ මිලදී ගැනීමේදී එම සැපයුම් ආයතන මගින් ණය සහන කාල සීමාවන් ලබා දිය නොහැකි බැවින් භාණ්ඩ මිලදී ගැනීමේදී , ඔවුන් ලබා දෙන ඇස්තමේන්තුව සමග , ඊට අදාළ චෙක්පතද ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇත. ඒ අනුව හදිසි කටයුතු වලදී අවම මිල ගණන් සහිතව ආයතන විසින් ලබා දෙන ඇස්තමේන්තුවට ලේකම්තුමාගේ සහ අදාළ විෂයෙහි යුතු අධීක්ෂණය යටතේ චෙක්පත ලියා අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙම කාරණය මගින් අදහස් කරන්නේ අපි භාණ්ඩ මිලදී ගැනීමේදී ඒත් සමගම ඔවුන් ලබා දෙන මිල ගණන් අනුව චෙක්පතද නිකුත් කළ යුතු බවයි. පවතින ආර්ථික තත්වය හා භාණ්ඩ මිල ඉහළ යාම මත එම ආයතන මගින් ණය සහන ලබා දීම ප්‍රතික්ෂේප කරලා තියෙනවා.

ඒ අනුව හදිසි භාණ්ඩ මිලදී ගැනීම් වලදී අවම මිල ගණන් සහිතව ආයතන විසින් ලබා දෙන ඇස්තමේන්තුවට අනුව ලේකම්තුමාගේ සහ අදාළ විෂයෙහි යුතු අධීක්ෂණය යටතේ චෙක්පත ලියා අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08- 4 .රන්දිය දහර ප්‍රජා මූල සංවිධානය පවරාදීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

රන්දිය දහර ප්‍රජා මූල සංවිධානය පවරාදීම සම්බන්ධවයි මැයෙන් එම සංවිධානයේ සභාපති , ලේකම් හා භාණ්ඩාගාරික යන අය විසින් 2022.11.12 දිනැතිව සිදු කර ඇති ඉල්ලීමට අනුව එම ප්‍රජා මූල සංවිධානය පවත්වා ගැනීමේ සහ නඩත්තු කිරීමේ දුෂ්කරතාවය මත එය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගන්නා ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව එම සංවිධානය සතු වත්කම් හා ලිපිලේඛන විධිමත් පරීක්ෂාවකින් පසුව භාර ගැනීම සුදුසු බවත් ඒ අනුව ඉදිරි නඩත්තු කටයුතු සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. සිරිසේන ගෙහෙවිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මේ ප්‍රජා මූල සංවිධානය විසින් අපෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. එහි වත්කම් සහ ජල පාරිභෝගිකයින් පිළිබඳ පරීක්ෂාවක් කරලා අපි භාර ගනිමු. ඊට පසුව අපි ප්‍රජා මූල සංවිධානය නඩත්තු කරමින් මේ පාරිභෝගිකයින් සඳහා ජලය ලබා දෙමු.

**<u>ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා.</u>**

මේ ජල සංවිධානය පාඩු ලබන එකක්ද? පාරිභෝගිකයින් කොපමණ ප්‍රමාණයක් සිටිනවද? ඉදිරියේදී මේ ආකාරයට ඇතැම් ප්‍රජා මූල සංවිධාන අපිට පවරා දෙන්න පුළුවන්. ඒවායේ මෝටර් සවි කිරීම් ආදි නඩත්තු කටයුතු එම සංවිධාන වලට කර ගන්න අපහසු තත්වයක් තමයි තියෙන්නේ.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

දැනට පාඩු ලබන තත්වයක් නැහැ. පාරිභෝගිකයින් 182 ක් පමණ ඉන්නවා. දැනට ගැටළුවක් නැතිව කරගෙන යනවා. අපිට ඒ අය සමග ගිවිසුමක් අත්සන් කරන්න වෙනවා. ඒ සඳහා ගිවිසුම් ගාස්තු වශයෙන් මුදලක් අය කරන්න වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා.</u>**

අපි ගිවිසුම් වලට විශාල මුදලක් අය කරන්න බැහැ. අපි සුළු මුදලක් අය කරමු . මේ සඳහා අපේ නිළධාරීන් යවලා වාර්තාවක් ලබා ගනිමු.

**<u>ගරු ප්‍රා.ස.ස. එම්.ඩී.සුගතදාස මැතිතුමා.</u>**

මේ පවරා ගැනීමේදී ඒ සංවිධානයේ සියළුම නිළධාරීන් රැස් කරලා අපේ නිළධාරීන් ද සමග සාකච්ඡාවක් පවත්වලා මේ පවරා ගැනීම කරනවා නම් හොඳයි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

පසුගිය දිනක ඒ සම්බන්ධව රැස්වීමක් පැවැත්වුවා. මම ඒ සඳහා සහභාගී වෙලා මේ සම්බන්ධ පැහැදිලි කිරීමක් කළා. මෙක ගැටළුවක් නැහැ. පාඩු ලබන තත්වයක තියෙනවා නම් අපි අරගෙන තේරුමක් නැහැ. නමුත් මේ සංවිධානය ඒ තත්වයට පත් වෙලා නැහැ.

**<u>ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමණි, මේ ප්‍රජා මූල සංවිධානය අපි ගැන යම් විශ්වාසයක් තියලා තමයි මේ වත්කම් අප වෙත පවරන්න තීරණය කරලා තියෙන්නේ. ඒ නිසා අපි ඒ පවරා ගැනීම කරලා ජල පාරිභෝගිකයින් වෙත අපගේ සේවාව ලබා දෙමු.

ඒ අනුව රන්දිය දහර ප්‍රජා මූල සංවිධානය සතු වත්කම් හා ලිපිලේඛන විධිමත් පරීක්ෂාවකින් පසුව භාර ගැනීම සම්බන්ධවත් ඒ අනුව ඉදිරි නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධවත් විරුධ්ධ අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-5. ජංගම මත්ස්‍ය අලෙවිසැළෙහි බදු කුලිය ගෙවීම සම්බන්ධව සහනයක් ලබා ගැනීම</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ජංගම මත්ස්‍ය අලෙවිසැළෙහි මුදල් ගෙවීම සඳහා සහනයක් ඉල්ලා සිටීම මැංගෙන් කිරම, වරාපිටිය පාර, ලලන්ත හාඩ්වෙයාර් ලිපිනයෙහි පදිංචි ඩබ්.බී. ධම්මික මයා විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව ඔහු විසින් ලබා ගෙන ඇති කිරම නගරයේ ජංගම මත්ස්‍ය අලෙවි සැළ සඳහා ගෙවිය යුතු රු. 131 039.33 බදු කුලිය එකවර ගෙවීමට නොහැකි බැවින් ඒ සඳහා සහන කාලයක් ඉල්ලුම් කර

ඇත. ඒ අනුව 2023 ජනවාරි 01 දින සිට මාස 06ක කාල සීමාවක් තුළ එම මුදල් අයකර ගැනීම සඳහා සහන කාලයක් ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස. එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා.</u>

අපි ඒ සඳහා සහන කාලයක් ලබා දෙමු.

ඒ අනුව කිරම නගරයේ ජංගම මත්ස්‍ය අලෙවි සැල සඳහා ගෙවිය යුතු රු. 131 039.33 ක මුදල එකවර ගෙවීමට නොහැකි බැවින් ඒ සඳහා සහන කාලයක් ලෙස 2023 ජනවාරි 01 දින සිට මාස 06ක කාල සීමාවක් තුළ එම මුදල් අයකර ගැනීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-06. විවෘත ලිපි ගොනු කබඩ් එකක් ලබා ගැනීම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

විවෘත ලිපි ගොනු කබඩ් එකක් ලබා ගැනීම මැයෙන් කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්.දිනුජිත් රන්දුල මයා විසින් 2022.11.15 දිනැතිව සිදු කර ඇති ඉල්ලීමට අනුව ලේකම්තුමන්ගේ කාමරය සඳහා අවශ්‍ය විවෘත ලිපි ගොනු කබඩ් එකක් සහ ලිපි ගොනු බහාලුම් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

අපි ඒ භාණ්ඩ මිල කැඳවීම් කරලා අරගෙන දෙමු.

ඒ අනුව ලේකම්තුමන්ගේ කාමරය සඳහා අවශ්‍ය විවෘත ලිපි ගොනු කබඩ් එකක් සහ ලිපි ගොනු බහාලුම් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-7. කටුවන මහජන සති පොළෙහි වතුර රැඳීම වැළැක්වීමට කාණු පද්ධතියක් සකස් කිරීම සඳහා සකස් කරන ලද සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

කටුවන මහජන සති පොළ සිල්ලර පොළෙහි වතුර රැඳීම වැළැක්වීමට කාණු පද්ධතියක් සකස් කිරීම සඳහා සකස් කරන ලද සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 09 හා 2022.11.16 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඒ සඳහා සකස් කරන ලද රු. 3 860 128.90 සංශෝධිත ඇස්තමේන්තුව අනුව එම කර්මාන්තය සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කටුවන මහජන සති පොළ සිල්ලර පොළෙහි වතුර රැඳීම වැළැක්වීමට කාණු පද්ධතියක් සකස් කිරීම සඳහා සකස් කරන ලද සංශෝධිත වියදම් ඇස්තමේන්තුවට මහා සභා අනුමැතිය ලබා ගැනීම මැයෙන් අංක කප්‍රාස 09 හා 2022.11.16 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඒ සඳහා සකස් කරන ලද රු. 3 860 128.90 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුව එම කර්මාන්තය සිදු කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-8. වවුචර් සඳහා ගෙවීම් කිරීම

## ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් සඳහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 168 -ජී.පී.එච්. ප්‍රියන්ත, මහින්ද සයිකල් ස්ටෝර්ස්, වීරකැටිය පාර, මිද්දෙනිය- කටුවන ප්‍රා.ස. බූකන්දයාය ජල පොම්පාගාරයේ විදුලි පද්ධතිය අවශ්‍ය ට්‍රිප් ස්විච් 1ක් මිලදී ගැනීම - රු.21750.00

02. වවුචර් අංක 867 - සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පුද්) සමාගම, ගල්අරඹ, කඹුරුගමුව, මාතර - සභාව සතු MG 330 අංක දරණ මෝටර් ග්‍රේඩරයට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම රු.148212.00

03. වවුචර් අංක 868 - සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පුද්) සමාගම, ගල්අරඹ, කඹුරුගමුව, මාතර - ZA 2978 බැකෝ යන්ත්‍රයට value solenoid එකක් මිලදී ගැනීම.- රු. 29325.00

04. වවුචර් අංක 890 - කේ.එස්.එස්.සී.සමරසිංහ, සූරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස් , වලස්මුල්ල පාර, කටුවන - 227-5870 වෑන් රථය වාර සේවා කිරීම - රු.28185.00

05.වවුචර් අංක 167 - විජිත සර්විස් සෙන්ටර්, කටුවන පාර, මිද්දෙනිය - BAK 9907 යතුරු පැදිය වාර සේවා කිරීම - රු.2250.00

06. වවුචර් අංක 887 - ජේ.ඒ. අනුර කුමාර,අනුර හයිඩ්‍රොලික් හෝස් සර්විස්, වීරකැටිය.- ZA 2978 JCB යන්ත්‍රයට ¾ හයිඩ්‍රොලික් හෝස් 1ක් දැමීම.- රු. 4900.00

07.වවුචර් අංක -886 - ජේ.ඒ.අනුර කුමාර ,අනුර හයිඩ්‍රොලික් හෝස් සර්විස්, වීරකැටිය - ZA 2978 JCB යන්ත්‍රයට හයිඩ්‍රොලික් ලීටර් 07ක් මිලදී ගැනීම.- රු. 4670.00

08. වවුචර් අංක -889- ජේ.ඒ.අනුර කුමාර ,අනුර හයිඩ්‍රොලික් හෝස් සර්විස්, වීරකැටිය - ZA 2978 JCB යන්ත්‍රයට අවශ්‍ය caltex hydrolic හා Caltex grease මිලදී ගැනීම.රු.12650.00

09. වවුචර් අංක -888- ජේ.ඒ.අනුර කුමාර ,අනුර හයිඩ්‍රොලික් හෝස් සර්විස්, වීරකැටිය - ZA 2978 JCB යන්ත්‍රයේ ½ හයිඩ්‍රොලික් හෝස් එකේ වැඩ නිම කිරීම.-රු.8350.00

10. වවුචර් අංක -12-මිතුරු ගොවි සංවිධානය, මිද්දෙනිය බටහිර - මිද්දෙනිය බටහිර ඉසුරු මාවතේ සිට සමගි මාවත දක්වා සංවර්ධනය - රු.106364.8610.

11. වවුචර් අංක -11- ප්‍රබුද්ධ ගොවි සංවිධානය, ගෙල්ලල -අඹකොළගොඩ පාර ජනසවි මාවත ප්‍රජා ශාලාව පිහිටි මාර්ගය කපා සංවර්ධනය කිරීම - රු.573925.32

12. වවුචර් අංක -170 - ශක්ති එන්ටර්ප්‍රයිසස්,මහ වීදිය, පල්ලෙගම, ඇඹිලිපිටිය -මිද්දෙනිය උතුර ජල පොම්පාගාරයේ සිදු වූ විදුලි පරිපථ අක්‍රිය වීම හේතුවෙන් ලබා ගත් නව උපාංග සඳහා වියදම - රු.11010.00

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ස. එම්.බී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් විශාල ප්‍රමාණයක් මහා සභාව වෙත ඉදිරිපත් වෙනවා. මේ වවුචර් මුදල් කමිටුව මගින් පරීක්ෂා කිරීමක් සිදු නොවෙන නිසා මහා සභාවට ඉදිරිපත් කරන වවුචර් ප්‍රමාණය අඩු කර ගන්නවා නම් හොඳයි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මුදල් කමිටුවට වවුචර් ඉදිරිපත් කළාට පසුව සභාව තියන දවස වෙද්දි තවත් ඉක්මණින් ගෙවිය යුතු වවුචර් ප්‍රමාණයක් එකතු වෙනවා. මෙම ගෙවීම් පරක්කු කරන්න අපහසු වෙලාවට සභාවට ඉදිරිපත් කරලා අනුමැතිය අරගෙන ගෙවන්න වෙනවා.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් සඳහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-9. එගොඩබැද්ද වරාපිටිය මාර්ගය ආරම්භක ස්ථානයේ පැති බැම්ම ඉදි කිරීමට අදාළ ඇස්තමේන්තුව</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

එගොඩබැද්ද වරාපිටිය මාර්ගය ආරම්භක ස්ථානයේ පැති බැම්ම ඉදි කිරීම සඳහා සකස් කරන ලද රු. 355966.78ක ඇස්තමේන්තුව අනුව එම කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.සුගත් සරඹගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව එගොඩබැද්ද වරාපිටිය මාර්ගය ආරම්භක ස්ථානයේ පැති බැම්ම ඉදි කිරීම සඳහා සකස් කරන ලද රු. 355 966.78ක ඇස්තමේන්තුව අනුව එම කර්මාන්තය සභා අරමුදලින් සකස් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-10. සියාරපිටිය , ගම්මන්වෙල මාර්ගයේ පිහිටි රජය සතු ඉඩම සම්බන්ධවයි</u>

<u>ගරු ප්‍රා.ස.ස.ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා.</u>

සියාරපිටිය ග්‍රාම නිළධාරි වසමෙහි ගම්මන්වෙල මාර්ගයේ පිහිටි රජය සතු ඉඩමෙහි විශාල භූමි ප්‍රමාණයක් නොමැති හෙයින් ඒ ආසන්නයේ පිහිටි විහාරස්ථානය වෙත ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මෙම කොටස සුසාන භූමියක් සඳහා ඉල්ලනවා. නමුත් නිවාස ගොඩක් මැද සුසාන භූමියක් දෙන එකේ තේරුමක් නැහැ. මෙතන පර්චස් 40-50ක පමණ කුඩා කොටසක් තමයි තියෙන්නේ. එය පන්සලට ලබාදීම සම්බන්ධව විරුද්ධත්වයක් නැති බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත දන්වා යවමු.

**ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මගේ තීරණයත් ගෙවල් ගොඩක් මැද සුසාන භූමියක් අවශ්‍ය නැහැ කියන එක තමයි. එතන විහාරස්ථානයේ හාමුදුරුවන් දෙනමක් වැඩ සිටිනවා. අපි ඒ බිම් කොටසත් විහාරස්ථානයටම ලබා දෙමු.

ඒ අනුව සියාරපිටිය ග්‍රාම නිලධාරී වසමෙහි ගම්මන්වෙල මාර්ගයෙහි පිහිටි රජය සතු ඉඩමෙහි සීමිත බිම් කොටසක් පවතින බැවින් එය යාබද විහාරස්ථානයට ලබා දීම සම්බන්ධව කටුවන ප්‍රාදේශීය සභාවේ විරුද්ධත්වයක් නොමැති බව කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යැවීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-11. කාබනික පොහොර මිල අඩු කිරීම සම්බන්ධව**

**ගරු ප්‍රා.ස.ස ජේ.ඒ.ගාමිණී මැතිතුමා.**

හෙල්ලල කොම්පෝස්ට් අංගනය විසින් දැනට නිෂ්පාදනය කර ඇති කාබනික පොහොර වල මිල ගනන් ඉහළ බැවින් ඒවා මිලදී ගැනීමේ ප්‍රවණතාවය පහළ මට්ටමක පවතින අතර අනෙකුත් කාබනික පොහොර නිෂ්පාදන ආයතන වල පොහොර මිලට සාපේක්ෂව මෙම කාබනික පොහොර මිල අඩු කිරීම  සුදුසු බව යෝජනා කරමි.

ගරු උප සභාපති ජේ.ටී.ශාන්ත  මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

දැනට සාමාන්‍යයෙන් අනෙක් තැන්වල කාබනික පොහොර කිලෝ එකක මිල රු. 20.00 වගේ පවතිනවා. අපිත් ඒ මිලට ලබා දෙමු.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනයේ නිෂ්පාදිත කොම්පෝස්ට් 1 Kg ක මිල රු. 20 .00 බැගින් ඉදිරියේදී අලෙවි කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-12. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ස.කේ රන්ජන් වීරසේකර මැතිතුමා**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයත් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ස. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා  ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු  අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ස. එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**09.ප්‍රගතිය සාකච්ඡා කිරීම**

**ගරු ප්‍රා.ස.ස සිරිසේන හෙට්ටිගේ මැතිතුමා මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මහාමාර්ග සංවර්ධන අධිකාරියේ මග නැගුම ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් කරපු අය සදහා දැනට ගෙවීම් කරලා නැහැ. ඒ අය ගොඩක් අසරණ තත්වයක තමයි ඉන්නේ. ඒ ගැන සභාවේ යෝජනාවක් විදියට ඉල්ලීමක් කරන්න කියලා ඉල්ලනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මම මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය සමග කථා කළා.  අයවැය සම්මත වීමෙන් පසුව බිල් සදහා ගෙවීම් කටයුතු කරන බව තමයි කිව්වේ.

**<u>ගරු ප්‍රා.ස.ස මානෙල් දිසානායක මැතිතුමිය</u>**

ගරු සභාපතිතුමණි, කොහොඹපේරුව ප්‍රජා ශාලාව ප්‍රදේශයේ ජනතාවට පාවිච්චි කිරීමට හැකි පරිදි ලබා ගන්න පුළුවන්ද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ඒ ගොඩනැගිල්ලේ යතුර පසුගිය දිනක අපිට ලබා දුන්නා. ප්‍රදේශයේ ජනතාව එකතු වන රැස්වීමක ග්‍රාම සංවර්ධන සමිතියකට වගේ යතුරු දෙන්න පුළුවන්. සභාව මගින් පාලනය වන ගොඩනැගිල්ලක් විදියට ජනතාවට පාවිච්චි කරන්න එය ලබා දෙමු.

**<u>ගරු ප්‍රා.ස.ස සුගත් සරබගේ මැතිතුමා</u>**

ගරු සභපතිතුමණි, අද අපි 2023 වර්ෂයේ අයවැය සභා සම්මත කළා. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා විරුද්ධත්වය ප්‍රකාශ කළත් අනෙක් අය සහයෝගය ලබා දීලා බහුතර ඡන්දයෙන් අයවැය සභා සම්මත වුණා. ඒ පිළිබඳ සියලු දෙනාටම ස්තූතිය ප්‍රකාශ කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ස ආරියරත්න ඒකනායක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අපි මාර්ග වල කාණු පද්ධතිය අවහිර වන ස්ථාන පිළිසකර කිරීම ගැන කථා කළා. මිද්දෙනිය පනාමුර ඉන්ධන පිරවුම් හල පහුවෙලා යද්දී මාර්ගය අවහිර වන ලෙස බැද්ද වැවිලා තියෙනවා. ඒ ගැන අවධානය යොමු කරන්න ඕන. ඒත් එක්කම ආදුළුගොඩ මාර්ගය හැකි පමණින් කපලා සකස් කරලා තියෙනවා. ප්‍රධාන මාර්ගයත් කපා සකස් කරලා තියෙනවා. අනෙක් කාරණය විදියට ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටු රැස්වීම සදහා අපිට කැඳවීම ලැබුණෙ නැහැ. ඒක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් තමයි ඒ කාර්යය වෙන්න ඕන. ඒ සම්බන්ධව ඔබතුමන්ගේ අවධානය යොමු කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අපිට ඇමතුම් දිනපොත් ලබාදීම ගැන පසුගිය දිනක කථා කළා. එහිදි ශාස්ත්‍ර දිනපොතක්ද ලබා දෙන්න පුළුවන් නම් හොදයි කියලා යෝජනා කරනවා. අනෙක් කාරණය විදියට පොළවල් ශුද්ධ පවිත්‍ර කිරීමේදී කටුවන වගේම මිද්දෙනිය දැල් වැටවල් ආශ්‍රිතව පොහොන් පදුරු එක්ක බැද්ද වැවිලා තියෙනවා. පොළ ඇතුළත වගේම ඒ ස්ථානත් ශුද්ධ පවිත්‍ර කරන්න ඕන. මිද්දෙනිය පොළේ මාළු ලැල්ල පැත්තත් අපිරිසිදුයි. කටුවන පොළේ ගොවිජන සේවා මධ්‍යස්ථානය පැත්තෙන් පස් කට්ටයක් තියෙනවා. එතන ලිස්සා යන ප්‍රමාණය වැඩියි. එම ස්ථානය කොන්ක්‍රීට් කර ගන්න තියෙනවා නම් හොදයි. ඒත් එක්කම මාර්ග පිරිසිදු කරද්දි ආදුළුගොඩ මාර්ගය පිරිසිදු කරලා තියෙනවා. ඉස්සර අපි පාරක් කපද්දි අවට මිනිස්සු එකතු වෙනවා. දැන් එවැනි ආකල්පමය හැගීමක් නැහැ. ඒ නිසා අපි ශ්‍රමදානයක් වගේ කරනවා නම් අවට මිනිස්සු දැනුවත් කරලා ඒ අයත් සහභාගි කරවා ගෙන අපේ වාහන මගින් පාරවල් දෙපස කපා ගෙන යන අතරේ මිනිස් ශ්‍රමය භාවිතා කරමින් එය ශුද්ධ කරන්න පුළුවන්. ඒ අතරේ හොදම මාර්ගය තෝරන්න තරගයක් පවත්වන්න වැනි දෙයක් කරන්න පුළුවන්. එවැනි ක්‍රමවේදයන් මගින් මාර්ග සකස් කිරීමේ ක්‍රමවේදයට යන්න කියලා මම යෝජනා කරනවා. අනෙක් කාරණය විදියට මෙවර 2023 අයවැය සභා සම්මත කළා. ඒ සඳහා විවාද ඇතත් නැතත් මම යෝජනා කරන්නේ අනාගත දරු පරපුරත් එක්ක යන ගමන් මෙහි ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් කරන්න හොද යෝජනා කිහිපයක් මෙහි ඇතුළත් වුණා. සූර්ය බල පද්ධතියක් සවි කිරීමේ ව්‍යාපෘතිය , පෙළ බොජුන් හලක් ස්ථාපිත කිරීම ආදිය මෙහි ඇතුළත් වුණා. ජනතාව වෙනුවෙන් යම් සේවාවක් කරන්න මෙම අයවැය පිටුවහලක් කර ගනිමු යයි යෝජනා කරනවා. ස්තූතියි.

## 10. - ස්තුතිය හා නිමාව.

අද දින 2022 වර්ෂයේ නොවැම්බර් මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වුන අපේ හිටපු ගරු සභාපතිතුමන් , ගරු සභිකතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරීතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තුතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 02.00 ට පමණ සභා කොරමේ සතුටින් විසිර ගියහ.

.............................

අයි. පී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.